## ලොව වටා පුවත් වියමන



# ඇමරිකාව කවන්ධය හා සටනට




ශ්‍රීලාල් සෙනෙවිරත්න

පිරිසකට එය ඇමරිකා ඉතිහාසයේ රනින් ලියැවෙන වීර ක්‍රියාකාරකමකි. තවත් පිරිසකට අනුව එය ඇමරිකා ඉතිහාසයේ කලු පැහැයෙන් සටහන් කෙරෙන දීන ක්‍රියාවකි. පිරිසකට එය ත්‍රස්තවාදයේ හිස සිදලීමකි. තවත් පිරිසකට අනුව එය ත්‍රස්තවාදයට නව ජීවය ලබාදීමකි. ....
කුමක්ද ඒ. එය නම් ඇමරිකාව සිදුකළ රහස් හමුදා මෙහෙයුමකින් අල්-ක්වයිදා නායක ඔසාමා බින් ලාඩන් ඝාතනය කිරීමයි.

පකිස්ථානයේ ඇබොටාබාද්හිදී බින් ලාඩන් ඝාතනය කෙරුණේ මැයි මස පළමුවනදා මැදියම් රාත්‍රියේදීය. ඔසාමා බින් මොහම්මද් බින් අවාද් බින් ලාඩන් හෙවත් ඔසාමා බින් ලාඩන් ඇමරිකාවේ පරම සතුරා බවට පත්වූයේ 2001 වසරේ සැප්තැම්බර් 11දා ඇමරිකාවේ නිව්යෝර්ක් නුවර ලෝක වෙළඳ මධ්‍යස්ථානය සහ පෙන්ටගනය ඉලක්ක කර එල්ල කළ බිහිසුණු මරාගෙන මැරෙන ගුවන් ප්‍රහාරවලින් පසුවය. පැහැරගත් මගී ගුවන්යානා හතරක් යොදාගනිමින් අල්-ක්වයිදා ප්‍රහාරකයන් එල්ල කිරීමට සැළසුම් කළ ප්‍රහාර අතරින් ඉලක්කය සාර්ථකව පසුරාගත්තේ ලෝක වෙළඳ මධ්‍යස්ථානයට එල්ල කෙරුණු ප්‍රහාරයේදීය. මේ ප්‍රහාරයෙන් විනාඩි කීපයක් ඇතුළත අඩු තරමින් තුන් දහසක්වත් ජීවිතක්ෂයට පත්වූහ. සිදුවූ දේපොළ හානිය ඩොලර් බිලියන ගණනකි. ඇමරිකාවේ ඉහළම ආරක්ෂාවක් ඇති පෙන්ටගනයට පවා ප්‍රහාර එල්ල කිරීමට ත්‍රස්තවාදී සංවිධානයක් සමත්වීමෙන් ලෝක පොලිස්කාරයාට සිදුවූ අවමානය මේ සියල්ලට නො-දෙවෙනි වූවාට සැක නැත. ලෝකයේ තැන තැන යුද ගිනි අවුළුවමින්, ඇතැම් ත්‍රස්තවාදී සංවිධානවලය පවා වක්‍ර සහයක් ලබාදෙමින් සිටි ඇමරිකාව ත්‍රස්තවාදය ලෝකයෙන් තුරන් කිරීමේ සටනට පිවි-සෙන්නේත්, ඔසාමා බින් ලාඩන් සොයා නොනවතින රහස් මෙහෙයුම් දියත් කරන්නේත් මේ ප්‍රහාරයෙන් පසුවය.

ඔසාමා දඩයම් කිරීමේ පළමු පියවර ඔහු සැඟව ඇතැයි විශ්වාස කෙරුණ ඇෆ්ගනිස්ථානයේ පැවැති තලේබාන් පාලනය බිඳ දමා ඇමරිකාවට අවශ්‍ය පරිදි හැසිරවිය හැකි ආණ්ඩුවක් එහි ස්ථාපිත කිරීමය. අනතුරුව ඇෆ්ගනිස්ථානයේ ඔසාමා සැගව ඇතැයි විශ්වාස කෙරෙන හැම අස්සක් මුල්ලක් කරාම නියමුවන් නැති ප්‍රහාරක යානා යොදවා ගුවන් ප්‍රහාර එල්ල කළේය. එහෙත් ඔසාමා නිරුපද්‍රිතව සිය කාර්යය කරගෙන ගියේය. මැයි පළමුවනදා අනපේක්ෂිත අයුරින් පකිස්ථානයට කඩා වදින ඇමරිකා නාවික හමුදාවේ සීල් බලකායේ ප්‍රහාරකයන් විසින් සිදුකළ මෙහෙයුමකින් ඔසාමා ඝාතනය වන්නේ ඔසාමා හඹා හා ඇමරිකා රහස් මෙහෙයුම්වල අවසන් ප්‍රතිඵලය ලෙසිනි.

අති නවීණ තාක්ෂණික උපක්‍රම සහ අවි යොදාගනිමින් විනාඩි හතලිහක් තුළ සීල් ප්‍රහාරකයන් සිදුකළ මෙහෙයුම අවසානයේ ඔසාමා මරා දැමුණු අතර ඔහුගේ සිරුර ගෙන ගොස් මුහුදට විසිකර දැමීමට සීල් භටයන් ක්‍රියා කළේය. ඉන් හෝරා කීපයකට පසු ධවල මන්දිරයේ සිට විශේෂ ප්‍රකාශයක් කරමින් ඇමරිකා ජනාධිපති බැරැක් ඔබාමා ජයග්‍රාහී ලෙසින් ඔසාමා ඝාතනය ලොවට හෙළි කළේය. එය ත්‍රස්තවාදයේ හිස සිඳදැමීමක් ලෙස හැඳින්වුණු අතර ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයට එල්ල කළ ප්‍රහාරයෙන් මියගිය වුන් වෙනුවෙන් සාධාරණය ඉටු කිරීමක් බව ඔබාමා ප්‍රකාශ කළේය. 1957 මාර්තු 10දා සෞදි අරාබියේ රියාද් නුවරදී ඔසාමා උපත ලැබුවේ සෞදි රජ පවුල සමග පවා සමීප සබඳතා තිබූ ධනවත් ව්‍යාපාරික පවුලකය. ඔහුගේ පියා මොහම්මද් බින් අවාද් බින් ලාඩන්ය. ඔසාමා උපත ලබන්නේ සිය පියාගේ දසවැනි බිරිය වූ හමීඩා අල් අටාස්ගේ එකම දරුවා ලෙසිනි. සෞදියේ අල් ටගාර් පාසලෙන් මූලික අධ්‍යාපනය ලැබූ ඔසාමා පසුව අබ්දුලාසිස් රාජකීය සරසවියට ඇතුළත්ව ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබාගත්තේය. පසුව සිවිල් ඉංජිනේරු උපාධියක් සහ පිරිස් කලමනාකරණ උපාධියක්ද හිමිකරගත් ඔසාමා ජිහාඩ් දර්ශණය ගරුකරමින් ජිහාඩ් සටන්කරුවකු බවට පත්විය.

ඔසාමා සටන්කරුවකු ලෙස කළඑළි බසින්නේ අසූව දශකය ආරම්භයේ සෝවියට් දේශය විසින් ඇෆ්ගනිස්ථානය ආක්‍රමණය කිරීමට එරෙහිවය. ජිහාඩ් නායකයෙකු වූ අබ්දුල්ලා අසාම් සමඟ එක්ව ඔසාමා 'මුක්තාබ් අල් කඩාමාට්' සංවිධානය පිහිටුවා ගත්තේය. එහි වර්ධනය සඳහා අවශ්‍ය සෑම සහය-ක්ම ඔහුට අරාබි ලෝකයෙන් ලැබිණ. එමෙන්ම සිය පෞද්ගලික ධනයද ඔහු නොමසුරුව ඒ සඳහා වැය කළේය. එම සංවිධානය ඇෆ්ගනිස්ථානයේදී සෝවියට් හමුදාවන්ට එරෙහිව ප්‍රහාර අරඹන විට ඇමරිකාවද හොර රහසින් ඊට සහාය දැක්වූයේය. මෙලෙස ඇෆ්ගනිස්ථානයේ සිය බල කදවුරු ගොඩනගා ගනිමින් කඩාමාට් සංවිධානය ව්‍යාප්තවෙද්දී අසාම් සමග ඇතිවූ මතභේද හේතුවෙන් ඔසාමා ඉන් ඉවත්ව 1988 අගෝස්තු 11 දා අල්-ක්වය-ිදා නමින් තමන්ගේ නායකත්වයෙන් වෙනම සංවිධානයක් පිහිටුවා ගත්තේය. ඉන් වසරකට පසු සෝවියට් හමුදා ඇෆ්ගනිස්ථානයෙන් ඉවත්ව ගිය පසු ඇෆ්ගනිස්ථානයේ සිට ජිහාඩ් දර්ශණය ඉදිරියට ගෙනයාමට අල්-ක්වයිදා සංවිධානය පියවර ගත්තේය.

අල්-ක්වයිදා සංවිධානය ඇමරිකාවට එරෙහි ප්‍රහාර අරඹන්නේ ඉරාකය කුවේටය ආක්‍රමණය කළ අවස්ථාවේදී ඇමරිකාව කුවේටයට ආධාර කර ඉරාක ප්‍රයත්නය පරාජය කිරීමෙන් පසුවය. එතැන් සිට ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල් ඉලක්ක කර අල්-ක්වයිදාව එල්ල කළ බිහිසුණු ප්‍රහාරවලින් දහස් ගණනක් ජීවිතක්ෂයට පත්ව එමෙන් කීප ගුණයක් තුවාල ලැබූහ. සිදුවූ දේපොළ විනාශය ද අති මහත්ය.

මෙහි නිමාවක් දකින්නට හැකි එකම ක්‍රමය අල්-ක්වයිදා නායක ඔසාමා ඝාතනය කිරීම බව ඇමරිකාව විශ්වාස කළේය. මැයි පළමුවනදා ඇබොටාබාද් හි මෙහෙයුම ක්‍රියාත්මක වන්නේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි. එය සිදුවූ ආකාරයත් ඒ සම්බන්ධයෙන් මතුව ඇති විවේචනත් මැයි මාසය පුරාවට ජනමාධ්‍ය ඔස්සේ ජනතාව අතරට ගෙන ගියේය. එබැවින් ඒ පිළිබඳ යමක් මෙහි සටහන් නොකරමි.

දැන් අප විමසා බැලිය යුත්තේ ඇමරිකාව මහත් උද්දාමයෙන් පැවසූ ආකාරයට ඔසාමා ඝාතනයත් සමඟ ත්‍රස්තවාදය අවසන්ව ඇතිද යන්නයි. ඔබාමා පැවසූ ආකාරයට ඔසාමා ඝාතනය ත්‍රස්තවාදයේ හිස සිඳීමක් නම් දැන් ඇමරිකාවට මෙන්ම ත්‍රස්තවාදයෙන් පීඩා විඳින අනෙක් රටවලටද දැන් බියෙන් සැකෙන් තොරව සුවසේ සිටින්නට හැකියාව ලැබී තිබිය යුතුය. එහෙත් සිදුව ඇත්තේ කුමක්ද ?

ඔසාමා ඝාතනයෙන් දෙවන දිනයේ ඇමරිකාව පාකිස්ථානයේ තිබූ සිය තානාපති සහ කන්සියුලර් කාර්යාල තුනක් වසාදමා ඒවායේ සිටි කාර්ය මණ්ඩලය සිය රට කැඳවාගත්තේය. සීල් බලකායේ භටයන්ට සහ ඔවුන්ගේ පවුල්වලට විශේෂ ආරක්ෂාවක් ලබාදුන්නේය. ඉන් දෙදිනකට පසු මැයි 05දා ඇමරිකාවේ පාසල් 29ක් හදිසියේ වසා ඒවායේ සිසුන්ගේ ජීවිතාරක්ෂාව සඳහා විශේෂ මෙහෙයුමක් ක්‍රියාත්මක කළේ 'ඇන්ත්‍රැක්ස් ජෛව රසායනික' ප්‍රහාරයකින් ආරක්ෂාවීමටය. ලොව පුරා සිටින සිය කාර්ය මණ්ඩලවල ආරක්ෂාව වෙනුවෙන් විශේෂ වැඩපිළිවෙළ ක්‍රියාවට නැගුවේය. මේ සියල්ල කළේ අල්-ක්වය-ිදාවේ කවන්ධයට ඇති බිය නිසාය. ඒ බිය අනියත බියක් නොවේ.

ඔසාමා ඝාතනයෙන් ත්‍රස්තාවදය අවසන් කළ හැකි බව ඇමරිකාව සිතා සිටියා නම් එය වැරදි තීරණයක් බව ඉන් පසු ඇතිවූ සිදුවීම් වලින් පෙනී යයි. සිය නායකයා ඝාතනයෙන් පසු අල්-ක්වයිදාව ප්‍රකාශ කළේ එහි පළිය ඇමරිකාවෙන් ගන්නා බවය. තලේබාන් සංවිධානය ප්‍රමුඛව මුස්ලිම් මූලධර්මවාදී ත්‍රස්ත සංවිධානද එලෙසම ඇමරිකාවට අනතුරු හඟවා සිටියේය.

ඒ අනතුරු හැඟවීම සනාථ කරමින් තලේබාන් ප්‍රහාරකයන් විසින් ඇෆ්ගනිස්ථානයේ කන්දහාර් නුවරට දරුණු ප්‍රහාරයක් එල්ල කෙරුණේ ඔසාමා ඝාතනයෙන් සතියක් ගෙවෙද්දීය. මැයි 08 දා එම ප්‍රහාරය එල්ල කෙරණේ කන්දහාර් ආණ්ඩුකාරවරයාගේ නිවෙස සහ නගරයේ වෙනත් විශේෂ ස්ථාන ගණනාවක් ඉලක්ක කරමිනි. මරාගෙන මැරෙන ප්‍රහාර හතක් ඇතුළුව සුලු අවි ප්‍රහාර රාශියක් එල්ල කෙරුණු මෙහිදී මිය ගිය සංඛ්‍යාව සහ සිදුවූ හානිය කෙතෙක්ද යන්න අනාවරණය නොවුණේ තලේබාන් ප්‍රහාරකයන් සහ ආරක්ෂක අංශ අතර ඇතිවූ ගැටුම් දින තුනක් තිස්සේ එක දිගට ඉදිරියට ඇදී ගිය හේතුවෙනි. කෙසේ වුවද ප්‍රහාරකයන් මෙන්ම පොලිස් සහ හමුදා සාමාජිකයන් රාශියක් මෙහිදී ජීවිතක්ෂයට පත්ව ඇති බව වරින් වර කන්දහාර් නුවරින් ලැබුණු විවිධ වාර්තා අනුව පෙනීයයි.

මැයි 13 වනදා මෙවැනිම බරපතල ප්‍රහාරයක් පාක-ිස්ථානයේදී එල්ල කෙරුණේ පුහුණුව ලබන පොලිස් භට කණ්ඩායම් කීපයක් ඉලක්ක කරගනිමිනි. පෙෂවාර් සිට කිලෝ මීටර් තිහක් පමණ දුරින් පිහිටි පොලිස් පුහුණු පාසලක් ඉදිරිපිටදී මරාගෙන මැරෙන බෝම්බකරුවන් දෙදෙනෙකු විසින් එල්ල කරන ලද මේ ප්‍රහාරයෙන් පොලිස් භටයන් 65 දෙනෙක් සහ සිවිල් වැසියන් 15 දෙනෙක් එම ස්ථානයේදීම ජීවිතක්ෂයට පත්වූහ. පොලිස් භටයන් ප්‍රවාහනයට යොදාගනු ලැබූ වාහන 12 ක් පමණ විනාශ කර දමන්නට ද මෙහිදී ප්‍රහාරකයන් සමත්ව තිබිණ.

මේ ප්‍රහාර දෙකම දෙරට මෑතදී ඇතිවූ දරුණුම ප්‍රහාර ලෙස සැළකේ. ප්‍රහාර දෙකම එල්ල වන්නේ ඔබාමාට අනුව ඇමරිකාව ත්‍රස්තවාදයේ හිස සුන් කිරීමෙන් පසුවය. හිස සුන් කළද කවන්ධය පෙරටත් වඩා ක්‍රියාකාරීව හැසිරෙන බව මින් පෙනීයයි.

ඔසාමා ඝාතනය ගැන කතාකරත්දී මීට දෙවසරකට පෙර ශ්‍රී ලංකාවේදී සිදුවූ ප්‍රභාකරන් ඝාතනය ද සිහිපත්වේ. ඔසාමා මෙන්ම ප්‍රභාකරන්ද අයත් වූයේ ලෝකයේ දරුණුතම ගරිල්ලා සංවිධනයක නායකයා ලෙසිනි. ශ්‍රී ලංකා භූමිය ලෙයින් නහවමින් දශක තුනක් තිස්සේ ඇදී ගිය දීර්ඝ කාලින සිවිල් යුද්ධයක එක් පාර්ශවයක් නියෝජනයේ කළේ ප්‍රභාකරන් නායකත්වය දුන් එල්ටීටීඊ සංවිධානයයි. හමුදාව ප්‍රභාකරන් ඝාතනය කළේ එල්ටීටීඊ සංවිධානයේ සෙසු සියලු නායකයන් ඝාතනය කර, සාමාජිකයන්ද විශාල පිරිසක් මරා දමා ආයුධ විශාල ප්‍රමාණයක් වනසා ප්‍රහාරක ශක්තිය බින්දුවට බැස්සීමෙන් පසුවය. ඒ සන්දර්භය තුල ප්‍රභාකරන් ජීවත්වුවද ඔහුට තවදුරටත් ත්‍රස්ත ප්‍රහාර එල්ල කරන්නට හැකියා-වක් ඉතිරිව තිබුණේ නැත. එල්ටීටීඊ ත්‍රස්තවාදය එතෙකින් අවසන් කරන්නට ලංකාවේ ආණ්ඩුව සමත්විය.

එහෙත් ත්‍රස්තවාදය අවසන් කරන්නට ඇමරිකාව ක්‍රියාකර ඇත්තේ මෙහි ප්‍රතිවිරුද්ධ ආකාරයෙනි. අල්-ක්වයිදාවේ නායකයා මරා දැමීමට ඇමරිකා-වට හැකි වුවත් එහි හෝ ඇමරිකාවට එරෙහිව සටන් වදින වෙනත් කණ්ඩායම්වල සංවිධාන ශක්තිය හෝ ප්‍රහාරක ශක්තිය බිඳ දමන්නට ඇමරිකාව සමත්ව නැත. ප්‍රභාකරන් ඝාතනයෙන් පසු එකම ත්‍රස්ත ප්‍රහාරයක් හෝ එල්ල කරන්නට එල්ටීටීඊයට හැකියාවක් නොතිබුණද ඔසාමා ඝාතනයෙන් පසු තවදුරටත් ත්‍රස්ත ප්‍රහාර එල්ල කරන්නට අල්-ක්වයිදා සහ තලේබාන් සංවිධානයන්ට ඉඩ ලැබී තිබේ. දැන් ඇමරිකාවට මුහුණ දීමට සිදුව ඇත්තේ ත්‍රස්තවාදයේ කවන්ධයටය. (හිස සුන් මළකදටය)

ශ්‍රීලාල් සෙනෙවිරත්න
(Srilal333@gmail.com)

